මගේ අංකය : JSC/SEC/CIR-L/2025

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 15/2025

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, සියලුම අධිකරණ නිළධාරින් සහ සියලුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් වෙත,

<u>තාවකාලික කාන්තා රැකවරණ නිවාස වෙත වින්දිත කාන්තාවන් යොමු කිරීම සම්බන්ධවයි</u>

ශීර්ෂගත කරුණට අදාලව කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් කේ. මහේෂන් මහතා විසින් අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද අංක:MWCA/WB/03/පොදු/2024 හා 2024.11.13 දිනැති ලිපිය හා සබැඳිව අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් රෝෂණී හෙට්ටිගේ මහත්මිය විසින් මා වෙත යොමු කරන ලද අංක: MOJ/L2/A-16/VOI-(ii) හා 2025.01.06 දිනැති ලිපිය හා බැඳේ. (අදාල ලිපිවල පිටපත් මේ සමඟ අමුණා ඇත)

02. ඒ පිළිබඳ සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය සහ ඇමුණුම සුදුසු කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක් කරන ලෙස මෙයින් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ඔක්තෝම්බර් මස 13 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

R16072.

9227

මගේ අංකය. / எனது இல. / My No: MWCA/WB/03/පොදු/2024

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය / திகதி. / Date: 2024.11.13

නීති අංශය 22 NOV 2024

RECEIVED 21 NOV 2024

කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

பெண்கள், சிறுவர் மற்றும் இளைஞர் விவகார மற்றும் விளையாட்டு அமைச்சு

**Ministry of Women, Child and Youth Affairs and Sports**

ලේකම්
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
නො. 19
ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10

<u>තාවකාලික කාන්තා රැකවරණ නිවාස වෙත වින්දිත කාන්තාවන් යොමු කිරීම</u>

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හමුවේ හිංසනයෙහි වින්දිතයන් බවට පත්වන කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් තාවකාලික රැකවරණය සැලසීම රජය විසින් ඉටුකළ යුතු කාර්යභාරයන් ලෙස සලකා කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් ගම්පහ, රත්නපුර, මොණරාගල, කොළඹ, මාතර, අනුරාධපුර (2), මඩකලපුව, මුලතිව් හා යාපනය යන දිස්ත්‍රික්කයන්හි රැකවරණ නිවාස 10ක් පවත්වාගෙන යනු ලබයි.

2. ගෘහස්ථ හිංසනයට ලක්වන වින්දිත කාන්තාවන් හා දරුවන් (වයස අවුරුදු 18ට අඩු ගැහැණු දරුවන් සහ අවුරුදු 12ට අඩු පිරිමි දරුවන්) සඳහා ආරක්ෂාව හා රැකවරණය ලබා දීම, ප්‍රතිකර්ම කිරීම, උපදේශන සේවා ලබා දීම, සමාජගත කිරීම සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබා දීම හා ආර්ථික, සමාජයීය වශයෙන් සවිබල ගන්වා නැවත සමාජගත කිරීම යන අරමුණින් යුතුව අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර, ඒ සඳහා වින්දිත කාන්තාවන් යොමු කිරීම අදාල ප්‍රදේශයේ දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත වනිතා සංවර්ධන නිලධාරීන් හෝ උපදේශන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

3. එමෙන් ම, සමහර අවස්ථාවන් හි දී අධිකරණ නියෝග මත වින්දිත කාන්තාවන් රැකවරණ නිවාස වෙත ඇතුළත් කිරීම සිදුවන අතර, එහි දී රැකවරණ නිවාස පවත්වාගෙන යාමේ මූලික අරමුණට අනුගත නොවන හා පරිපාලනමය වශයෙන් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුව ඇති බැවින්, පහත සඳහන් ආකාරයේ වින්දිත කාන්තාවන් තාවකාලික කාන්තා රැකවරණ නිවාස වෙත යොමු නොකිරීමට අදාල බල ප්‍රදේශයන්හි අධිකරණ දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

| | කාන්තා, ළමා | තරුණ කටයුතු සහ ක්‍රීඩා |
|---|---|---|
| ලේකම් /செயலாளர்/Secretary:- | 011-2186057 | 011-2671404 |
| කාර්යාලය/அலுவலகம்/office | 011-2186055 | 011-2697934 |
| ෆැක්ස්/பெக்ஸ்/Fax | 011-2187249 | 011- 2688836 |
| ඊමේල්/மின் தபால்/Email: | secretary@childwomenmin.gov.lk | secofsports@gmail.com |
| වෙබ් අඩවිය/இணையத்தளம்/Website: | www.childwomenmin.gov.lk | www.moys.gov.lk |
| | 05 වන මහල, II අදියර ,සෙත්සිරිපාය, බත්තරමුල්ල.<br>05 ஆம்மாடி, கட்டம் II, செத்சிறிபாய ,பத்தரமுல்லை.<br>05th Floor, Stage II, Sethsiripaya, Battaramulla | නො 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07<br>இல 09, பிலிப் குணவர்தன மாவத்தை, கொழும்பு 07<br>No.09, Philip Gunawardana Mawatha,Colombo 07 |

නිහඬ නොවන්න - දරුවන් රැකගන්න குரல் கொடுங்கள் - பிள்ளைகளைக் காப்பாற்றுங்கள் Raise your voice to protect children

1. මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ කාන්තාවන්
2. විවිධ වර්ගවල ආබාධ, බෝ වන රෝග හා සමාජ රෝග සහිත කාන්තාවන්
3. මානසික ආබාධ සහිත කාන්තාවන්
4. විශෝධනයට ලක් කල යුතු කාන්තාවන්

4. ගෘහස්ථ හිංසනයට ලක්ව රැකවරණය ලබන වින්දිත කාන්තාවන්ගේ පෞද්ගලික ආරක්ෂාව හා සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීමත්, සීමිත කාර්යමණ්ඩලයක් හා සීමිත සම්පත් ප්‍රමාණයක් මත මෙම රැකවරණ නිවාස පවත්වාගෙන යාමත් මත මෙම සීමා කිරීම සිදු කර ඇති බැවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

කේ. මහේෂන්
ලේකම්
කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

K. Mahesan
Secretary
Ministry of Women, ... Affairs and Sports
5th Floor, "Sethsiripaya"- Stage II,
Battaramulla.

පිටපත: දිස්ත්‍රික් ලේකම්, .................................... දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (දැන ගැනීම සඳහා)